**ජාතික ක්‍රීඩා අරමුදල - 2015**
**-----------------------------------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

2014 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 167,166 ක් වූ විගණන ගාස්තු අදාල වර්ෂයේදී උපචිත නොකිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

-------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන ගිණුමේ සහ ආයෝජන පොළී ගිණුමේ ශේෂයන් එදිනට ශේෂ සනාථ කිරීමේ ලිපි සමග සැසඳීමේදී එකතුව රු. 35,510 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------------

1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය ප්‍රකාරව ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත්, මෙම වගන්තිය ප්‍රකාර පරිපාලන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

[

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.39,213,989 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,061,490 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 24,152,499 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන රු. 15,000,000 කින් ඉහල යාම සහ මුළු වියදම රු.13,419,508 කින් පහල යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පත් කරන ලද පසුගිය වසර 05 තුල දූෂණ අක්‍රමිකතා සොයා බැලීමේ කමිටුවට සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දූෂණ හා වංචා සම්බන්ධව සොයා බැලීමේ කමිටුවට සමාලෝචිත වර්ෂයේදී අරමුදල මගින් එකතුව රු. 2,270,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාල කමිටු වාර්තා මගින් ලබා දී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අරමුදල මගින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යාංශයේ නඩත්තු භාර ඉංජිනේරුවරයාට හා ක්‍රීඩා අමාත්‍යාංශයේ පිළිගැනීම් නිලධාරිනියට පිළිවෙලින් රු. 258,000 ක් හා රු. 128,284 ක් ක්‍රීඩා අරමුදලින් ගෙවා තිබුණි. මෙම වියදම් ක්‍රීඩා අරමුදල පවත්වා ගෙනයාමේ වියදම් නොවන අතර, අමාත්‍යාංශයේ පරිපාලන වියදම් වේ. මෙම ගෙවීම ක්‍රීඩා අරමුදලේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන මුදල් චක්‍රලේඛයේ 5 වන ඡේදයේ 2 වන වගන්තියට අදාලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යය දීම දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යන අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම ඉලක්ක කර ගත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු විගණනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබු අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකක මඟින් ද සමාලෝචිත වර්ෂයේදී අරමුදලට අදාලව විගණනයක් සිදුකර නොතිබුණි. මෙම හේතුවෙන් අරමුදල් පරිපාලනය හා වියදම් සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු නොවන බව නිරීක්ෂණය කෙරේ.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තත්‍ය වියදම් සැසඳීමේදී වැය විෂයයන් 20 ක් අතුරින් අයිතම 17 ක සියයට 34 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

**-------------------------------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2013 හා 2014 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම. |